# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2286/22 – 2022 ජුනි මස 29 වැනි බදාදා – 2022.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණ සම්බන්ධයෙන් දක්වෙන විරෝධතාවයන් 2022 ජූලි මස 15 දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
සභාපති,
බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2022 ජුනි මස 15 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියෙස''
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1958 නොවැම්බර් මස 29 වැනි දින අංක 11605 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලද්දා වූ ද, අවසන් වරට 2018 ජූලි මස 16 වැනි දින අංක 2080/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් නව කොටස් ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

*II වන කොටස*

*කම්කරුවාගේ පන්තිය*

*''ඒ '' පන්තියේ කම්කරුවෝ -*

ෆෝමන්වරු, ප්‍රධාන බක්කරේවරු, ප්‍රධාන බාස්වරු, කෝකිහු, කේක්, ෂෝට්ඊට්ස් සාදන්නෝ, ප්‍රේස්ට්‍රි සාදන්නෝ, රසකැවිලි සාදන්නෝ සහ කේක් වැඩ දන්නෝ.

*''බී'' පන්තියේ කම්කරුවෝ -*

මෝලි අල්ලන්නෝ, මනින්නෝ සහ කිරන්නෝ, තැටි වෙන් කරන්නෝ, ගෙතුම්කරුවෝ, සූප පාන් වැඩකරන්නෝ, කැවිලි පිටි සාදන්නෝ, සූප පාන් යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, බදින්නෝ, බටර් සහ වැඩ දමන්නෝ, සීනි කලවම් කරන්නෝ, සීනි වැඩ දමන්නෝ සහ ඔතන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ.

**''සී'' පන්තියේ කම්කරුවෝ -**

පිටි දමන්නෝ, පිටි හලන්නෝ, රෝල් කරන යන්ත්‍රකරුවෝ, සීනි අඹරන්නෝ, මේසකරුවෝ, තැටි තෙල් ගල්වන්නෝ, තැටි වැඩ කරන්නෝ, පාන් තැටි වැඩකරන්නෝ, බනිස් තැටි වැඩකරන්නෝ, කේක් තැටි වැඩකරන්නෝ, පාන් පෙති කපන්නෝ, පළතුරු සහ එළවළු ශුද්ධ කරන්නෝ, කිරම (ක්‍රීම්) පුරවන්නෝ, පෝරණු අත්උදව්කරුවෝ, පෝරණුවට තැටි දමන්නෝ, තැටි අඩුක්කරන්නෝ, පාන් සහ බනිස් අඩුක්කරන්නෝ, කේක් අඩුක්කරන්නෝ, කපන්නෝ, සසින්නෝ, අතින් ඔතන්නෝ, අහුරන්නෝ, සාමාන්‍ය අත්උදව්කරුවෝ සහ ගෙනගොස් භාර දෙන්නෝ.

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| සේවා වර්ෂය | 'ඒ' පන්තිය<br>රු. ශත | 'බී' පන්තිය<br>රු. ශත | 'සී' පන්තිය<br>රු. ශත |
|---|---|---|---|
| 1 වසර | 21,166.00 | 19,333.00 | 17,500.00 |
| 2 වසර | 21,316.00 | 19458.00 | 17,600.00 |
| 3 වසර | 21,466.00 | 19,583.00 | 17,700.00 |
| 4 වසර | 21,616.00 | 19,708.00 | 17,800.00 |
| 5 වසර | 21,766.00 | 19,833.00 | 17,900.00 |
| 6 වසර | 21,916.00 | 19,958.00 | 18,000.00 |
| 7 වසර | 22,066.00 | 20,083.00 | 18,100.00 |
| 8 වසර | 22,216.00 | 20,208.00 | 18,200.00 |
| 9 වසර | 22,366.00 | 20.333.00 | 18,300.00 |
| 10 වසර | 22,516.00 | 20,458.00 | 18,400.00 |
| 11 වසර | 22,666.00 | 20,583.00 | 18,500.00 |

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දක්වෙන විරෝධතාවයන් 2022 ජූලි මස 15 දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සැම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරෝධතාවය දක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
සභාපති,
කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2022 මැයි මස 23 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියෙස'',
කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

*උපලේඛනය*

කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1959 අප්‍රේල් මස 29 වැනි දින අංක 11732 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයේ සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කළින්කල වෙනස් කරන ලද්දා වූ ද අවසන් වරට 2014.07.24 වැනි දින අංක 1872/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ එකී තීරණ, එම උපලේඛනයේ II වන කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් වෙනස් කළ යුතුය:

*II වන කොටස*

I තීරයෙන් දැක්වෙන නිශ්චිත කෑලි මිම්මේ හා කාල මිම්මේ වැඩ ප්‍රමාණයන්ට අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II තීරයෙහි දක්වා ඇති අනුරූප ප්‍රමාණයෙන් විය යුතුය.

| *1 වන තීරය*<br>විස්තරය | *II වන තීරය*<br>අවම වේතන ප්‍රමාණය<br>රු. ශත |
|---|---|
| **කාල මිම්මේ වැටුප් - දෛනික** | |
| නුහුරු පැහීම, අගල් දැමීම හා තට්ටු සකස් කිරීම, වල් නෙලීම | |
| ඉලුක් තණ ඉවත් කිරීම හා මායිම් එළි කිරීම(එක් දිනකට) | |
| කම්කරුවෙකුට | 730.00 |
| කුරුඳු තැලීම - දෛනික | |
| කම්කරුවෙකුට | 782.00 |
| **කෑලි මිම්මේ වැටුප් - ඒකකයකට** | |
| නුහුරු පැහීම - හෙක්ටයාරයකට, | 16,511.00 |
| අගල් දැමීම 18 x18 කානු දිග මීටර් 10 ට | 312.00 |
| වාර්ෂික වල් නෙලීම - හෙක්ටයාරයකට | 14,773.00 |

EOG06 - 0212/2

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

මල්, විසිතුරු පැල, එළවළු හා පළතුරු වගා කිරීමේ හා අපනයනය කිරීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥා පනතේ 33 (1) (අ) වැනි වගන්තිය යටතේ කම්කරු ඇමතිවරයා විසින් පනවනු ලැබ, 2015 මැයි මස 27 වැනි දින අංක 1916/12 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් මා වෙත පවරනු ලැබූ බලය ප්‍රකාරව කම්කරු කොමසාරිස් ජනරාල් බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති වන මම මල්, විසිතුරු පැල, එළවළු හා පළතුරු වගාකිරීමේ හා අපනයනය කිරීමේ කර්මාන්තයෙහි නියුක්ත, පහත උපලේඛනයෙහි සඳහන් සේවකයන් සම්බන්ධයෙන් වන දෛනික අවම වේතන ප්‍රමාණය එම ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ තීරණය කිරීමට අදහස් කරන බව එකී ආඥා පනතේ 28 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දක්වෙන විරෝධතාවයන් 2022.07.15 දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරෝධතාවය දක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද, ඊට අඩංගු විය යුතුය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්,

2022 ජූනි මස 20 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියෙස''
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

මල්, විසිතුරු පැල, එළවළු සහ පළතුරු වගා කිරීමේ සහ අපනයනය කිරීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව සභාව විසින් ඇතිකරනු ලදුව 2012 මාර්තු මස 09 වන දින 1748/16 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ, නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, අවසන් වරට 2017 ජූලි මස 17 වැනි දින අංක 2028/6 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද තීරණ තවදුරටත් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

මල්, විසිතුරු පැල, එළවළු හා පළතුරු වගා කිරීමේ හා අපනයනය කිරීමේ කර්මාන්තයෙහි නියුක්ත 1 කොටසේ සඳහන් කම්කරුවන්ට අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය 11 වැනි කොටසට අනුරූප සටහනෙහි දක්වෙන පරිදි විය යුතුය.

**1 වන කොටස**
**කම්කරුවන්ගේ පන්තිය**

**පුහුණු:** පටක හා බීජ රෝපනයේ නියැලෙන්නන්, බද්ධ කිරීමේ කටයුතුවල නියැලෙන්නන්, අපනයනය හා විකිණීම පිණිස මල්පැල, මල් හා මල්අතු සකසන්නන්, විසිතුරු පැල, අතු හෝ රිකිලි සකසන්නන්, තත්ත්ව පරීක්ෂාවේ යෙදෙන්නන්, දිලීර නාශක, කෘමිනාශක හා පොහොර යොදන්නන්, ඇසිරීමේ කාර්යයන්හි නියුක්ත සේවකයන්, ගබඩාකරුවන්, සේවක පරිපාලනයේ යෙදෙන්නන්, පුහුණුවක් අවශ්‍ය කාර්යයන්හි නියැලෙන්නන්,

**අර්ධ පුහුණු:** තවාන් දැමීම, පැල සිටුවීම හා වගාව නඩත්තු කරන සේවකයන්, එළදාව නෙලන්නන් සහ එකතු කරන්නන්, ගබඩා සහායකයින්, අර්ධ පුහුණු. වෙනත් සේවකයන්,

**නුපුහුණු:** වගාව පිණිස භූමිය සකස් කරන සේවකයන්, පැටවීමේ බෑමේ නියුක්ත කම්කරුවන්, පුහුණුවක් අවශ්‍ය නොවන වෙනත් සේවයන්හි නියැලෙන්නන්

II කොටස

ගෙවිය යුතු අවම වේතනය

| දෛනික | |
|---|---|
| | රු. ශත |
| නුපුහුණු | 500.00 |
| අර්ධ පුහුණු | 575.00 |
| පුහුණු | 625.00 |

EOG 06 – 0212/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී